وجوب العمل بسنة الرسول ﷺ - وكفر من أنكرها - **سنهالي**

# රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාගේ සුන්නාහ්ව අනුගමනය කිරීමේ අනිවාර්යභාවය සහ එය ප්‍රතික්ෂේප කළ අයගේ ප්‍රතික්ෂේපභාවය

محمد ﷺ


සංස්කරණය අෂ් ෂේයික්

අබ්දුල් අzසීස් බින් අබ්දුල්ලාහ් බින් බාzස්
අල්ලාහ් ඔහුට කරුණා කරත්වා!


Islamhouse.com

المحتوى الإسلامي


රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාගේ සුන්නාහ්ව අනුගමනය කිරීමේ අනිවාර්යභාවය සහ එය ප්‍රතික්ෂේප කළ අයගේ ප්‍රතික්ෂේපභාවය

අබ්දුල් අzසීස් බින් අබ්දුල්ලාහ් බින් බාzස්
අල්ලාහ් ඔහුට කරුණා කරත්වා!



تنشر الإسلام بأكثر من 100 لغة

موسوعة القرآن الكريم
QuranEnc.com
موسوعة تضم تفاسير وتراجم موثوقة لمعاني القرآن الكريم

موسوعة الأحاديث النبوية
HadeethEnc.com
موسوعة تضم ترجمات للأحاديث النبوية وشروحها بعدة لغات

موسوعة المصطلحات الإسلامية
TerminologyEnc.com
موسوعة تضم ترجمات المصطلحات الإسلامية وشروحها بعدة لغات

منتقى المحتوى الإسلامي
موسوعة تضم المنتقى من المحتوى الإسلامي باللغات

IslamHouse.com
مرجعية مجانية إلكترونية موثوقة للتعريف بالإسلام

جمعية الدعوة وتوعية الجاليات بالربوة

جمعية خدمة المحتوى الإسلامي باللغات

بسم الله الرحمن الرحيم

**අපරිමිත දයාන්විත අසමසම කරුණාන්විත වූ අල්ලාහ්ගේ නාමයෙනි**

ح جمعية الدعوة و الارشاد وتوعية الجاليات بالربوة ، ١٤٤٥ هـ
فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

بن باز : عبدالعزيز بن
وجوب العمل بسنة الرسول وكفر من انكرها - سنهالي. /
عبدالعزيز بن بن باز -ط١.. - الرياض ، ١٤٤٥

٢٨ ص ؛ ١٤ × ٢١ سم

ردمك: ٢-١٠-٨٤١٧-٦٠٣-٩٧٨

١- السنة النبوية ٢- اصول الفقه أ.العنوان

ديوي ٢١١،١٢ ١٤٤٥ / ٣٣٧٨

شركاء التنفيذ:

دار الإسلام جمعية الربوة رواد الترجمة المحتوى الإسلامي

يتاح طباعة هذا الإصدار ونشره بأي وسيلة مع
الالتزام بالإشارة إلى المصدر وعدم التغيير في النص.

Telephone: +966114454900
ceo@rabwah.sa
P.O.BOX: 29465
RIYADH: 11557
www.islamhouse.com

# පෙරවදන

සියළු ප්‍රශංසා සර්ව ලෝකයන්හි පරමාධිපති වූ අල්ලාහ්ටමය යහපත් අවසානය, දේව බිය බැතිමත්කමින් යුතු අයට වේ. අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය ඔහුගේ දාසයා හා ධර්ම දූතයා වූ අපගේ නබිවරයාණන් වන මුහම්මද් තුමාණන්හට අත් වේවා! එතුමාණෝ විශ්වයට මෛත්‍රියක් ලෙස එවනු ලැබූවෙකි. සියළු දාසයන් වෙත වූ සාධකයකි. තම පරමාධිපතිගේ දහම් ග්‍රන්ථය සහ තම දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්)ගේ සුන්නාහ්ව ඉසිලූ එතුමාණන්ගේ පවුලේ අය හටත් එතුමාණන්ගේ හිත මිතුරන් හටත් ඔවුන්ගෙන් පසු පැමිණි - අවංකකම හා බැතිමත්කම මෙන්ම අර්ථයන් සහ වචන සම්පූර්ණයෙන් ආරක්ෂා කිරීම අරමුණු කර ගත් - අය හටත් අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය අත් වේවා! අල්ලාහ් ඔවුන් ගැන තෘප්තිමත් වී ඔවුන් සතුටු කරත්වා!

ආගමික තීන්දු පිහිටුවීමේදීත්, අනුමත දේ සහ තහනම් දේ පැහැදිලි කිරීමේදීත් සලකා බලනු ලබන ප්‍රධාන මූලධර්මය සර්ව බලධාරි අල්ලාහ්ගේ ග්‍රන්ථයයි. ඒ බව සහ එයට ඉදිරියෙන් හෝ පිටුපසින් හෝ අසත්‍යතාවයක් කිසිසේත් සමීප නොවන බව පැරණි හා නූතන විද්වතුන් ඒකමතිකව එකඟ වී ඇත. ඉන්පසු සලකා බලන මූලධර්මය අල්ලාහ්ගේ දූතයාණන්ගේ සුන්නාහ් ව නම් එතුමාගේ සම්ප්‍රදාය පිහිටා ඇත. එතුමාණෝ සිය මනෝ ඉච්ඡාවට අනුව කතා කරන්නෙකු නොවීය.

සැබවින්ම එතුමා කතා කරනුයේ එතුමාට දන්වනු ලැබූ දේව හෙළිදරව් පමණය. ඉන්පසු විද්වතුන් එකඟ වූ ඒකමතික තීන්දුය. මේ මූලධර්ම හැර වෙනත් මූලධර්ම පිළිබඳ විද්වත්හු වෙනස් වූ මත දරති. ඉන් වඩාත්ම වැදගත් වන්නේ කියාස් නම් සැසඳීම තුළින් ගනු ලබන සාධකයයි. සැලකිය යුතු එහි කොන්දේසි සපුරා ඇත්නම්, විද්වතුන් බහුතරයක් එය එක් සාධකයක් ලෙස සලකති. මෙම

මූලධර්ම සඳහා ඇති සාක්ෂි සාධක අප්‍රමාණය. ඒ පිළිබඳ සඳහන් කිරීමට අවශ්‍ය නොවන තරමට ඒවා ඉතා ප්‍රසිද්ධය.

# ආගමික තීන්දු පිහිටුවීමේදී සලකා බලනු ලබන මූලධර්ම

ආගමික තීන්දු පිහිටුවීමේදී සලකා බලනු ලබන මූලධර්ම වනාහි:

## පළමු වැනි මූලධර්මය

සර්ව බලධාරී අල්ලාහ්ගේ ග්‍රන්ථය නම් අල්කුර්ආනයයි. මෙම ග්‍රන්ථය අනුගමනය කිරීම, එයට අනුකූලව කටයුතු කිරීම සහ එහි සීමාවන්හි නැවතීම අනිවාර්ය බව සර්වබලධාරී අපගේ පරමාධිපතියාණන් ඔහුගේ ග්‍රන්ථයේ බොහෝ තැන් වල පෙන්වා දී ඇත.

- උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි. **"නුඹලාගේ පරමාධිපතිගෙන් නුඹලා වෙත පහළ කරනු ලැබූ දෑ නුඹලා අනුගමනය කරනු. තවද ඔහු හැර (වෙනත් අය) භාරකරුවන් ලෙස ගනිමින් නුඹලා අනුගමනය නොකරනු. ස්වල්ප වශයෙනි නුඹලා උපදෙස් ලබනුයේ."**

- උත්තරීතර අල්ලාහ් තවදුරටත් මෙසේ පවසයි: **"තවද අපි පහළ කළ මෙම පුස්තකය භාග්‍ය සම්පන්නය. එබැවින් නුඹලා එය පිළිපදිනු. නුඹලා බිය බැතිමත් වනු. නුඹලා කරුණාව ලැබිය හැකිය."**

- තවද මෙසේ පවසයි: **"ධර්ම ග්‍රන්ථයෙන් නුඹලා සඟවමින් සිටි දැයින් බොහෝමයක් නුඹලාට පැහැදිලි කරන, තවද බොහෝ දේවල් නොසලකා හරින, අපගේ රසූල්වරයා සැබැවින්ම නුඹලා වෙත පැමිණ ඇත. සැබැවින්ම අල්ලාහ්ගෙන් වූ ආලෝකයක් ද පැහැදිලි ධර්ම ග්‍රන්ථයක් ද නුඹලා වෙත පැමිණ ඇත."**

● තවද මෙසේ පවසයි: **"තමන්ගේ තෘප්තිය පසුපස හඹා යනවුන් හට එමගින් ඔහුගේ ශාන්තියේ මාවත් දෙසට මඟ පෙන්වනු ඇත. ඔහුගේ අනුහසින් අන්ධකාරයන්ගෙන් ආලෝකය වෙත ඔවුන් ව ඔහු ගෙන යනු ඇත. තවද ඍජු මාර්ගය වෙත ඔහු ඔවුන්ට මඟ පෙන්වනු ඇත."**

● තවද මෙසේ පවසයි: **"නියත වශයෙන්ම ඔවුන් වෙත අනුශාසනාව පැමිණි කල්හි එය ප්‍රතික්ෂේප කළවුන් ද (මතු ලොවෙහි දඬුවම් කරනු ලබන්නෝ වෙති.) තවද නියත වශයෙන්ම එය අති බලගතු ග්‍රන්ථයකි. එයට ඉදිරියෙන් හෝ එයට පසුපසින් හෝ අසත්‍ය දෑ ඒ වෙත නොපැමිණෙනු ඇත. එය මහා ප්‍රඥාවන්ත ප්‍රශංසා ලාභියාගෙන් වූ පහළ කිරීමකි."**

● තවද මෙසේ පවසයි: **"තවද මෙම අල් කුර්ආනය මට වහී (දේව පණිවිඩ) වශයෙන් දෙනු ලැබීය. (එය) මෙමගින් නුඹලාට හා මෙය ලබන අයට මා අවවාද කරනු පිණිසය."**

● තවද මෙසේ පවසයි: **"මෙය ජනයා වෙත කෙරෙන දැනුම් දීමකි. තවද එමගින් ඔවුන් අවවාද ලබනු පිණිස..."**

මෙම අර්ථයෙන් යුත් අල් කුර්ආන් වැකි බොහෝමයක් දක්නට ලැබේ. අල්-කුර්ආනය පිළිපදින ලෙසත්, එය තදින් ග්‍රහණය කර ගන්නා ලෙසත් අපට අණ කරන අල්ලාහ්ගේ දූතයාණන්ගේ පූර්ව සාධක සහිත හදීස් රාශියක් වාර්තා වී ඇත. කවරෙකු එය පිළිපදින්නේ ද ඔහු යහ මඟෙහි සිටින බවත් කවරෙකු එය අත්හැරියේ ද ඔහු නොමඟෙහි සිටින බවත් ඒවා පෙන්වා දෙයි. මේ අතරින් සමුගැනීමේ හජ් වන්දනාවේ දී, එතුමාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) විසින් සිදු කළ දේශනාවේ දී එතුමාණන් මෙසේ පැවසූ බව සනාථ වී ඇත. **"ඔබ එය තදින් පිළිපදින්නේ නම්, කිසිවිටෙකත් ඔබ නොමඟ නොයන කරුණක් මම ඔබ අතර තබා යමි. එය අල්ලාහ්ගේ ග්‍රන්ථයයි."** මෙය මුස්ලිම් තුමා තම සහීහ් ග්‍රන්ථයේ වාර්තා කර ඇත.

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව, සෙ^zයිද් ඉබ්නු අර්කම් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලද බව, සහීහ් මුස්ලිම් හි මෙසේ වාර්තා වේ. "**මම ඔබ අතර ඉතා වැදගත් කරුණු දෙකක් අත්හැර යමි. ඉන් පළමුවැන්න අල්ලාහ්ගේ ග්‍රන්ථයයි. එහි මඟ පෙන්වීම සහ ආලෝකය ඇත. එබැවින් අල්ලාහ්ගේ ග්‍රන්ථය තදින් ග්‍රහණය කර ගෙන ඒ අනුව පිළිපදින්න.**" එතුමාණෝ අල්ලාහ්ගේ ග්‍රන්ථය පිළිබඳ උනන්දු කරවා පසුව මෙසේ කීවේය. "**මාගේ නිවැසියෝ, මම මාගේ නිවැසියන් විෂයෙහි දෙවියන්ව මම ඔබට මතක් කර සිටිමි. මම මාගේ නිවැසියන් විෂයෙහි දෙවියන්ව මම ඔබට මතක් කර සිටිමි.**"

අල්කුර්ආනය පිළිබඳ සඳහන් කිරීමේ දී වෙනත් වාර්තාවක මෙසේ සඳහන් වී ඇත: "**එය අල්ලාහ්ගේ (ශක්තිමත්) කඹයයි. එය පිළිපදින්නා යහමඟ මත සිටියි. එය අත්හරින්නා මුළාව මත සිටියි.**" මේ අර්ථයෙන් යුත් හදීසයන් රාශියක් ඇත. එමෙන් ම අල්ලාහ්ගේ ග්‍රන්ථය පිළිපැදීම, එමඟින් තීන්දු තීරණ ගැනීම සහ අල්ලාහ්ගේ දූතයාණන්ගේ (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) සුන්නාහ්ව සමඟ එය යොමු කිරීම අනිවාර්ය වේ. එය සහාබාවරුන් හා ඔවුනට පසු පැමිණි දේවත්වය විශ්වාස කරන අයගේ හා විද්වතුන්ගේ සම්මුතියයි. ඒ සම්මුතිය තුළ ප්‍රමාණවත් සාධක රාශියක් ඇත. එහෙයින් මේ සම්බන්ධව පැමිණි සාක්ෂි දීර්ඝ ලෙස සඳහන් කිරීම අවශ්‍ය නොවේ.

## දෙවන මූලධර්මය

නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් ගැන වාර්තා වූ සම්මත හදීස්. එමෙන්ම එතුමාගේ හිතමිතුරන්, ඔවුනට පසු පැමිණි දේවත්වය විශ්වාස කරන අය හා විද්වතුන් හරහා සම්මත වූ දෑ.

-සම්මුතිය ඇති මූලාශ්‍ර තුනෙන්- දෙවන මූලාශ්‍රය සම්බන්ධයෙන් ගත් කල: එය අල්ලාහ්ගේ දූතයාණන්, එතුමාණන්ගේ සහාවරුන් සහ ඔවුන්ගෙන් පසුව පැමිණි දැනුමෙන් හා විශ්වාසයෙන් යුත් පුද්ගලයින් හරහා සම්මත වූ කරුණුය. ඔවුහු මේ ප්‍රධාන මූලාශ්‍රය ගැන විශ්වාස කළෝය. එය සාධකයක් ලෙස උපයෝගී කළෝය. එමෙන් ම එය සමූහයාට ඉගැන්වූවෝය. ඔවුන් ඒ පිළිබඳව බොහෝ ග්‍රන්ථ රචනා කරන්නට යෙදුනෝය. ඔවුන් මෙය උසූලුල් ෆික්හ් (ආගමික නීති මූලාධාර) සහ මුස්තලහ් (පරිභාෂා ශාස්ත්‍රය Terminology) වැනි පොත්වල පැහැදිලි කර ඇත. ඒ සඳහා ඇති සාක්ෂි අපමණ ය. ඒ අතර සර්වබලධාරී අල්ලාහ්ගේ ශුද්ධ ග්‍රන්ථයේ එතුමාණන්ව අනුගමනය කරන ලෙසද එතුමාණන්ට කීකරු වන ලෙසද අණ කරන ආඥාව ද එක් සාධකයකි. මෙම ආඥාව එතුමාණන්ගේ කාලයේ ජීවත් වූ අය සහ ඔවුන්ගෙන් පසු ජීවත් වූ අය වෙත යොමු කරනු ලැබේ. මන්ද එතුමාණෝ ලෝ වාසී සියල්ලන් වෙත එවනු ලැබූ අල්ලාහ්ගේ දූතයාණන් වන බැවිනි. එමෙන් ම අවසාන දිනය දක්වා ම එතුමාණන්ට කීකරු වන ලෙසද, එතුමාව අනුගමනය කරන ලෙසද ඔවුන් අණ කරනු ලැබූ හේතුවෙනි. තවද එතුමාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) අල්ලාහ්ගේ ග්‍රන්ථය විවරණය කරන්නාය. එතුමාණන්ගේ වදනින්, ක්‍රියාවෙන් සහ පිළිගැනීමෙන් එහි ඇති අලංකාර දේ පැහැදිලි කරන්නාය. සුන්නාහ්ව නොහොත් නබි පිළිවෙත නොතිබුනේ නම්, සලාතයේ රකඅත් ගණන, ඒවායේ ස්වරූපය සහ ඒවායේ

අනිවාර්ය කරුණු ගැන මුස්ලිම්වරු දැනගත නොහැකි වන්නට තිබුණි. උපවාසය, සකාත් නම් අනිවාර්ය බද්ධ, හජ් වන්දනාව, අල්ලාහ්ගේ මාර්ගයේ කැප වීම, යහපත නියෝග කර අයහපත තහනම් කිරීම යනාදී සම්බන්ධ නීති රීති පිළිබඳ විස්තර ඔවුන්ට දැනගත නොහැකි වන්නට තිබුණි. එමෙන් ම ගණුදෙනු සහ තහනම් කරුණු පිළිබඳ සහ අල්ලාහ් ඔවුනට පනවන ලද සීමාවන් සහ දඬුවම් පිළිබඳ විස්තර ඔවුන්ට දැනගත නොහැකි වන්නට තිබුණි.

● **සුන්නාහ් ව පිළිබඳව සඳහන් කරන අල්කුර්ආන් වැකි.**

සුන්නාහ් ව පිළිබඳ සඳහන් කරන අල්කුර්ආන් වැකි අතරින්, ආලු ඉම්රාන් සූරාවෙහි උත්තරීතර අල්ලාහ්ගේ වාක්‍යය පහත දැක්වේ.

**"තවද නුඹලා කරුණාවට පාත්‍ර විය හැකි වනු පිණිස නුඹලා අල්ලාහ්ට ද මෙම ධර්ම දූතයාට ද අවනත වනු."** (3:132.)

● සූරා නිසා හි උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි.

**"විශ්වාස කළවුනි! නුඹලා අල්ලාහ්ට අවනත වනු. එමෙන්ම රසූල්වරයාට ද, නුඹලා අතර කටයුතු භාර අයට ද අවනත වනු. නමුත් යම් කරුණක නුඹලා එකිනෙකා මත ගැටුම් ඇති කර ගත්තෙහු නම්, නුඹලා අල්ලාහ් හා පරමාන්ත දිනය විශ්වාස කරන්නන් ව සිටියෙහු නම්, එවිට එය අල්ලාහ් වෙත ද රසූල් වරයා වෙත ද යොමු කරනු. එය වඩා ශ්‍රේෂ්ඨය. එමෙන්ම (එහි) අවසානය ද වඩා අලංකාරය.** (4:59)

● තවද, එම සූරාවෙහි ම උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි.

**"කවරෙකු (අල්ලාහ්ගේ) දූතයාණන්ට අවනත වන්නේ ද ඔහු සැබැවින්ම අල්ලාහ්ට අවනත විය. කවරෙකු පිටුපාන්නේ ද (දැනගනු) අපි නුඹව ඔවුන් වෙත ආරක්ෂකයකු ලෙස නොඑව්වෙමු."** (4:80)

එතුමාගේ සුන්නාහ්ව සාධකයක් නොවූයේ නම් හෝ ඒවා සියල්ල සංරක්ෂණය නොවූ තත්ත්වයක තිබුණේ නම්, එතුමාට කීකරු වීම සහ යම් ගැටළු සහගත අවස්ථාවක දී මිනිසුන් අල්ලාහ්ගේ ග්‍රන්ථය සහ ඔහුගේ දූතයාගේ සුන්නාහ් වෙත යොමු විය හැකි වන්නේ කෙසේද? එසේ වූවා නම් පැවැත්මෙහි නැති දෙයක් වෙත අල්ලාහ් තම ගැත්තන් යොමු කළා සේ වනු ඇත. මෙසේ කීම අසත්‍යයකි. අල්ලාහ් ව දැඩි සේ ප්‍රතික්ෂේප කිරීමකි. ඔහු පිළිබඳ වැරදි ආකල්පයකි. සූරා අන් නහ්ල් හි අල්ලාහ් මෙසේ ප්‍රකාශ කර ඇත: "**තවද ඔවුන් වෙත පහළ කරනු ලැබූ දෑ ජනයාට නුඹ පැහැදිලි කරනු පිණිස නුඹ වෙත (අල් කුර්ආනය නොහොත්) මෙම මෙනෙහි කිරීම අපි පහළ කළෙමු. තවද එය ඔවුන් වටහා ගනු පිණිසය.** (16:44)

● තවද එහි සඳහන් තවත් වාක්‍යයක් මෙසේය:
"**තවද කවර දෙයක ඔවුන් මත ගැටුම් ඇති කර ගත්තේ ද එය ඔවුනට නුඹ පැහැදිලි කරනු පිණිස ද, දේවත්වය විශ්වාස කරන ජනයාට මග පෙන්වීමක් හා ආශිර්වාදයක් වනු පිණිස ද මිස අපි නුඹ වෙත ධර්ම ග්‍රන්ථය පහළ නොකළෙමු.**" (16:64)

නබිතුමාණන්ගේ සුන්නාහ්වට යම් පැවත්මක් හෝ එහි යම් වලංගුභාවයක් නැතිනම් අල්ලාහ් තම නබිවරයා වෙත ඔවුනට පහළ කළ දෑ පැහැදිලි කිරීමේ වගකීම භාර දෙන්නේ කෙසේද? තවද, සූරා අන් නූර් හි උත්තරීතර අල්ලාහ්ගේ ප්‍රකාශය මෙලෙසය: "**නුඹලා අල්ලාහ්ට අවනත වනු. තවද පණිවිඩකරුට ද අවනත වනු යැයි (නබිවරය!) නුඹ පවසනු. නමුත් නුඹලා පිටුපෑවෙහු නම් එවිට ඔහු මත පටවනු ලැබූ දෑ ඔහු කෙරෙහිය, නුඹලා මත පටවනු ලැබූ දෑ නුඹලා කෙරෙහිය. තවද නුඹලා ඔහුට අවනත වන්නෙහු නම් නුඹලා ඍජු මග ලබනු ඇත. රසූල්වරයා වෙත පැවරෙනුයේ පැහැදිලි ව දන්වා සිටීම මිස නැත.**" (24:54)

● තවද එම සූරාවෙහි උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා ඇත:
**"තවද නුඹලා දයාව ලබනු පිණිස නුඹලා සලාතය විධිමත් ව ඉටු කරනු. සකාත් ද පිරිනමනු. රසූල්වරයාට ද අවනත වනු."**

● සූරා අල් අඃරාෆ් හි ඔහු මෙසේ පවසා ඇත:
**"අහෝ ජනයිනි! සැබැවින්ම මම නුඹලා සියලු දෙනා වෙත වූ අල්ලාහ්ගේ ධර්ම දූතයා වෙමි. අහස් හා පොළොවේ ආධිපත්‍යය ඔහු සතුය. ඔහු හැර නැමදුමට වෙනත් සුදුස්සෙකු නොමැත. ඔහු ජීවය දෙයි. තවද මරණයට පත් කරයි. එබැවින් නුඹලා යහමඟ ලැබිය හැකි වනු පිණිස අල්ලාහ් ව ද, ඔහු හා ඔහුගේ වදන් විශ්වාස කරන ඔහුගේ දූත උම්මි (ශාක්ෂරතාව නොදන්නා) නබිවරයාව ද විශ්වාස කරනු. තවද ඔහුව අනුගමනය කරනු." (යැයි නබිවරය) පවසනු."**

තවද මෙම වාක්‍යයන් හී, මඟ පෙන්වීම සහ දයාව, එතුමාණන් අනුගමනය කිරීම තුළ ඇති බවට පැහැදිලි ඇඟවීමක් ඇත. එතුමාණන්ට (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) එතුමාණන්ගේ සුන්නාහ්ව අනුගමනය නොකිරීමෙන් හෝ එය වලංගු නොමැති බව හෝ විශ්වාසය නොතබන බව පැවසීමෙන් හෝ මේවා ලැබිය හැකි වන්නේ කෙසේද?

● සූරා අන් නූර් හි -උත්තරීතර- අල්ලාහ් මෙසේ ප්‍රකාශ කර ඇත:
**"කවරෙකු අල්ලාහ්ගේ නියෝගයට පිටුපාන්නේ ද, ඔහු තමන්ට ඇති විය හැකි යම් පරීක්ෂාවක් හෝ වේදනීය දඬුවමක් ගැන ප්‍රවේසම් විය යුතුය."**

● සූරා අල් හෂ්ර් හි ඔහු මෙසේ පවසා ඇත:
**"රසූල්වරයා නුඹලාට කුමක් පිරිනැමුවේ ද එය නුඹලා ගනිවු. ඔහු නුඹලාට කුමක් තහනම් කළේද එයින් වැළකී සිටිවු."**

තවද මෙම අර්ථයෙන් යුතු අල්කුර්ආන් වැකි බොහෝ ය.

-අල්කුර්ආනය පිළිපැදීම, එහි අණපනත් හා තහනම් කිරීම්වලට කීකරුවීමේ අනිවාර්යභාවය පිළිබඳ පෙර සඳහන් වූ අයුරින්- ඒ සියල්ලෙන් පෙන්නුම් කරන්නේ, එතුමාණන්ට කීකරු වීමේ අනිවාර්යභාවය සහ එතුමාණන් ගෙන ආ දේ අනුගමනය කිරීමේ අනිවාර්යභාවයයි. එතුමාණන්ට ශාන්තිය හා සමාදානය අත්වේවා !

මෙම මූලාශ්‍ර දෙක එකිනෙකට බැඳී ඇත. දැනුමෙන් හා දේව විශ්වාසයෙන් යුත් විද්වතුන්ගේ එකඟතාවයට අනුව, එයින් එකක් ප්‍රතික්ෂේප කරන තැනැත්තා අනෙක් මූලාශ්‍රය ද ප්‍රතික්ෂේප කර, එය බොරු කරන්නෙකි. එසේ කිරීම දේව ප්‍රතික්ෂේපයකි; නොමඟ යෑමකි. ඉස්ලාමීය රාමුවෙන් බැහැරවීමකි. ඒ පිළිබඳ නබි -සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්- තුමාණන්ගේ හදීස්වල සඳහන් සාධක මෙසේය. නබිතුමාට කීකරු වීම, එතුමා ගෙන ආ දේ අනුගමනය කිරීම පිළිබඳ අනිවාර්යභාවය සහ එතුමාට අකීකරු වීමේ තහනම සම්බන්ධයෙන් නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් විසින් ප්‍රකාශ කළ බොහෝ හදීස් වාර්තා වී ඇත. එය එතුමාණන්ගේ කාලයේ සිටි අය ඇතුළුව එතුමාට පසු නැවත නැඟිටීමේ දිනය දක්වා පැමිණෙන අයට ද අදාලය.

● බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථවල සඳහන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා පැවසූ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලද මෙම නබි වදන ද ඒ සාධක වලින් එකකි. **"කවරෙකු මට අවනත වන්නේ ද ඔහු අල්ලාහ්ට අවනත විය. කවරෙකු මට විරුද්ධ වන්නේ ද ඔහු අල්ලාහ්ට විරුද්ධ විය."**

● සහීහ් අල් බුහාරි හි එතුමා විසින් නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් පැවසූ බව මෙසේ වාර්තා කරන ලදී: **"මගේ සමාජයේ සෑම කෙනෙකුම ස්වර්ගයට යන්නෝය. ප්‍රතික්ෂේප කළවුන් හැර." යනුවෙන් නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණෝ වදාළහ. එවිට ජනතාව, "අල්ලාහ්ගේ**

**දූතයාණනි! ප්‍රතික්ෂේප කළවුන් කවුරුන් දැ?" යි විමසුවෝය. එවිට එතුමාණෝ, "මට අවනත වන අය ස්වර්ග ගත වේ. මට විරුද්ධ වූ අය ප්‍රතික්ෂේප කළවුන් බවට පත් වෙති." යනුවෙන් පිළිතුරු දුන්හ.**

● අල්ලාහ්ගේ දූතයාණන් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් පැවසූ බව අල්-මික්දාම් ඉබ්නු මඃදී කරිබ් (රළියල්ලාහු අන්හු) තුමා වාර්තා කරන හදීසයක් අහ්මද් හා අබූ දාවූද් යන ග්‍රන්ථ වල ද නිවැරදි සම්ප්‍රේෂණ දාමයක් සහිතව හාකිම් හි ද මෙසේ වාර්තා වේ. **"දැනගන්න! මා වෙත ධර්ම ග්‍රන්ථය හා ඒ සමඟම ඒ හා සමාන දෑ ලැබී ඇත. දැනගන්න! පිරුපුන් මිනිසෙක් තම යහන මත සිට ඔබට මෙසේ පවසයි. ඔබ අල්කුර්ආනය පිළිපදින්න. එහි යම් දෙයක් සඳහා අවසරය ඇති නම් එය අනුමත කරගන්න. එහි යම් දෙයක් සඳහා තහනම පනවා තිබේ නම් එය තහනම් කරගන්න."**

● අබූ දාවූද් සහ ඉබ්නු මාජා හි නිවැරදි සම්ප්‍රේෂණ දාමයක් සහිතව අබූ රාෆිඃගේ පුතනුවන් විසින් වාර්තා කළ නබි වදනක මෙසේ වාර්තා වේ."**මා තහනම් කළ හෝ මා නියෝග කළ යම් කරුණක් ඔහු වෙත පැමිණියේ නම්, 'අප මේ පිළිබඳ නොදනිමු' යැයි පවසා, 'අල්ලාහ්ගේ ග්‍රන්ථයෙහි කුමක් තිබේද එය අපි අනුගමනය කරන්නෙමු' යැයි පවසන කෙනෙකු මා ඔබලා අතුරින් සැබැවින්ම නොදැකිය යුතුයි."**

● මික්දාම් ඉබ්නු මඃදී කරිබ් (රළියල්ලාහු අන්හු) තුමාණන්ගේ ප්‍රකාශයට තමන් සවන් දුන් බව හසන් බින් ජාබිර් තුමාණෝ මෙසේ වාර්තා කර ඇත: කයිබර් දිනයෙහි ඇතැම් කරුණු නබි -සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්-තුමාණෝ තහනම් කළහ. ඉන් පසු එතුමාණන් විසින් මෙසේ ප්‍රකාශ කරන ලදී: **"මතුවට ඔබෙන් කෙනෙකු මා බොරු කරනු ඇත. ඔහු සුවපහසුවෙන් හාන්සි වී සිටින්නෙකු වේ. ඔහුට මාගේ හදීසයක් කියනු ලැබේ. එවිට ඔහු 'අප හා ඔබ අතර අල්ලාහ්ගේ ග්‍රන්ථය ඇත. එහි ඇති අනුමත දෑ අපි අනුමත**

**කරන්නෙමු. එහි ඇති තහනම් දෑ අපි තහනම් කරන්නෙමු' යැයි ප්‍රකාශ කරනු ඇත. අහෝ ජනයිනි! දැනගන්න! අල්ලාහ්ගේ දූතයාණෝ යම් දෙයක් තහනම් කළේ නම් එය අල්ලාහ් යම් දෙයක් තහනම් කළා හා සමානය.** නිවැරදි සම්ප්‍රේෂණ දාමයක් සහිතව හාකිම්, තිර්මිදි සහ ඉබ්නු මාජා එය වාර්තා කර ඇත.

● අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තම දේශනයේදී, '**එම දේශනයට සහභාගීවූවන් එයට සහභාගී නොවූවන්ට දන්වා සිටිය යුතු යැ'යි ද, 'සවන් දෙන අයට වඩා අනෙකාට දන්වා සිටින අය වඩාත් සවිඥානක යැ'යි ද ඔවුන්ට උපදෙස් දුන්හ.** ඒ පිළිබඳ බහුල ලෙස නබිවදන් වාර්තා වී ඇත.

● නබි -සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්- තුමාණෝ සමුගැනීමේ හජ් වන්දනාවෙහි අරෆා දින සහ අවුරුදු උත්සව දින කළ දේශනාවෙහි රැස්ව සිටි පිරිසට පැවසූ බව බුහාරි හා මුස්ලිම් හි සඳහන් මෙම නබි වදන ද ඉන් එක් සාධකයකි. "**සහභාගීවූවන් එයට සහභාගී නොවූවන්ට දන්වා සිටිය යුතුයි. සවන් දුන් අයට වඩා අනෙකාට දන්වා සිටින අය වඩාත් සවිඥානකය.**"

එතුමාණන්ගේ සුන්නාහ්ව එය සවන් දුන් අයට සහ එය සන්නිවේදනය කළ අයට සාක්ෂියක් නොවන්නේ නම්, එය නැවත නැගිටීමේ දිනය දක්වා පවතිනු නොලබන්නේ නම්, ඒවා ඔවුන්ට ප්‍රකාශ කරන ලෙස එතුමාණෝ ඔවුන්ට අණ නොකරනු ඇත. සුන්නාහ්ව මූලාධාරයක් ලෙස හෙබවීම නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ගේ ප්‍රකාශයට සෘජුව සවන් දුන් අයට මෙන්ම ඒවා නිවැරදි සම්ප්‍රේෂණ දාමයන් සමඟ ලැබුනු අයට ද අනිවාර්ය බව මෙයින් දැනගනු ලැබේ.

අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්-ගේ සගයන් විසින් එතුමාගේ වාචික හා ක්‍රියාවන් සම්බන්ධ සුන්නාහ්ව (පිළිවෙත) සුරක්ෂා කරන ලදී. ඔවුන් එය ඔවුන්ගෙන් පසුව

අනුගාමිකයන් වෙත සම්ප්‍රේෂණය කළ අතර, ඒ අනුගාමිකයන් ඔවුන්ගෙන් පසුව පැමිණි අයට එය දන්වා සිටියහ. මේ අනුව, විද්වත්හු එය පරම්පරාවෙන් පරම්පරාවට සහ සියවසෙන් සියවසට සම්ප්‍රේෂණය කළහ. ඔවුන් ඒවා ඔවුන්ගේ පොත්වල එකතු කර ඉන් දුර්වල සහ නිවැරදි ඒවා පැහැදිලි කළහ. තවද දුර්වල වාර්තාවෙන් දැන්වූ හදීසය, නිවැරදි අයගෙන් වාර්තා වූ හදීසයෙන් වෙන්කර හඳුනා ගැනීමට ඔවුන් ප්‍රසිද්ධ නීති සහ රෙගුලාසි ඇති කළෝය. බුහාරි හා මුස්ලිම් යන සත්‍ය ග්‍රන්ථ ඇතුළු අනෙකුත් හදීස් ග්‍රන්ථ ඔවුහු උපයෝගි කළ අතර ඒවා සම්පූර්ණයෙන්ම ආරක්ෂා කළේ පහත සඳහන් අල්කුර්ආන් වැකිය තහවුරු කිරීම වස් අල්ලාහ් තම උත්තරීතර ග්‍රන්ථය අපයෝජකයන්ගේ අපයෝජනයෙන්, අදේවවාදීන්ගේ අදේවවාදයෙන් සහ අසත්‍යවාදීන්ගේ අසත්‍යයෙන් ආරක්ෂා කළ ආකාරයටම ය. **"නියත වශයෙන්ම මෙම මෙනෙහි කිරීම (දේව ග්‍රන්ථය) පහළ කළේ අපය. තවද නියත වශයෙන් අපි එහි ආරක්ෂකයෝ වෙමු."**

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) ගේ සුන්නාහ්ව පහළ කරනු ලැබූ දිව්‍යමය හෙළිදරව්වක් බවට සැකයක් නැත. අල්ලාහ් තම ග්‍රන්ථය සංරක්ෂණය කර ඇති ආකාරයටම සුන්නාහ්ව ද ආරක්ෂා කර ඇති අතර, ඒ සඳහා බුද්ධිමත් විද්වතුන්ව ද පත් කර ඇත. ඔවුන් අසත්‍යවාදීන්ගේ විකෘති කිරීම් සහ නූගත් අයගේ අර්ථ නිරූපණයන්ගෙන් එය ආරක්ෂා කරනු ඇත. තවද නූගත්, බොරුකාරයන් සහ අදේවවාදීන් එයට නන්අයුරින් සම්බන්ධ කර ඇති සියල්ල එයින් වෙන් කර පැහැදිලි කරනු ඇත. මක්නිසාද යත්, අල්ලාහ් එය (සුන්නාහ්ව) තම උතුම් ග්‍රන්ථයේ අර්ථ නිරූපණයක් බවට පත් කර ඇති අතර එහි ඇති සංෂිප්ත නීති පිළිබඳ පුළුල් පැහැදිලි කිරීමක් වශයෙන් එය පත් කොට, ශුද්ධ වූ ග්‍රන්ථයේ සඳහන් නොවන වෙනත් නීති පිළිබඳ පැහැදිලි කිරීම් ද ඒ තුළ ඇතුළත් කොට ඇත. උදාහරණ ලෙස මව්කිරි දීම පිළිබඳ

නීතිය, දේපළ උරුමය, කාන්තාවක් සහ ඇගේ නැන්දණිය එකට විවාහ කිරීම තහනම් කිරීම වැනි දේ සම්මත හදීස් හි සඳහන් වුව ද ශුද්ධ වූ අල්කුර්ආන්හි සඳහන් නොවූ වෙනත් තීන්දුය.

## සහාබාවරුන්ගෙන්, තාබිඊන්වරුන්ගෙන් සහ ඔවුන්ගෙන් පසු පැමිණි විද්වතුන්ගෙන් සුන්නාහ්වට ගරු කිරීම සහ ඒ අනුව ක්‍රියා කිරීමේ වගකීම පිළිබඳව වාර්තා වූ ඇතැම් ප්‍රකාශ...

● අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලද ප්‍රකාශයක් බුහාරි හා මුස්ලිම් හි මෙසේ සඳහන් වේ. "අල්ලාහ්ගේ දූතයාණෝ මිය ගිය මෙහොතේ අරාබිවරුන් අතරින් ඉස්ලාමය අත්හළ අය ඉස්ලාමය අත්හළ විට, අබු බක්ර් අස්සිද්දීක් (රළියල්ලාහු අන්හු) තුමාණෝ- මෙසේ පැවසීය: "අල්ලාහ් මත දිවුරා පවසමි. සලාතය හා සකාතය අතර වෙනස දක්වන අය සමඟ මා සැබැවින්ම සටන් කරන්නේමය. එවිට උමර් (රළියල්ලාහු අන්හු) තුමාණෝ මෙසේ පැවසූහ: "ඔබ එසේ ඔවුන් සමඟ සටන් කරනුයේ කෙසේද? මන්ද, නබි - සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් - තුමාණෝ මෙසේ පවසා ඇත්තාහ": **"නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙක් නැත යැයි පවසන තෙක් ජනයා සමඟ අරගල කිරීමට මට අණ කෙරිණි. ඔවුන් එය පැවසුවහොත්, ඔවුන්ගේ රුධිරය සහ ඔවුන්ගේ දේපළ -නිසි අයිතියකින් හැර- මාගෙන් ආරක්ෂා වනු ඇත."** එවිට අබූ බක්ර් තුමාණෝ මෙසේ පැවසූහ: ස$^{z}$කාතය එයට අයත් දෙයක් නොවේද? අල්ලාහ් මත දිවුරා පවසමි. නබි -සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්- තුමාණන් වෙත ඔවුන් දුන් දෙයක් මා වෙත ඔවුන් නොදුන්නේ නම් එසේ කිරීම හේතුවෙන් මා ඔවුන් සමඟ සටන් කරන්නෙකු වෙමි. එවිට උමර් (රළියල්ලාහු අන්හු) තුමාණෝ මෙසේ පැවසූහ: අල්ලාහ් අබූ බක්ර්ගේ හදවත විවෘත කළ බව මා එවිට දැනගතිමි. සැබැවින්ම ඔහු පවසන දෑ සත්‍ය බව මා අවබෝධ කර ගතිමි. ඉන්පසු අනෙකුත් සහාබිවරුන්ද එතුමාව අනුගමනය

කළෝය. ඒ අනුව ඉස්ලාම් දහම හා ඇදහිලි අත හැර දමා ගිය අයව ඉස්ලාමය වෙත නැවත එක් කිරීම සඳහා සටන් මෙහයෙවන ලදී. ඇදහිලි අතහරින්නට බල කළ අයට සුදුසු දඬුවම් දුන්හ.

මේ සිද්ධි මාලාව තුළ සුන්නාහ්වෙහි මහගු බව සහ ඒ අනුව ක්‍රියා කිරීම අනිවාර්ය බව දන්වන පැහැදිලි සාධක පිහිටා ඇත. මහළු සහාබා කාන්තාවක් ඇගේ උරුමය ගැන විමසීමට අබූ බක්ර් අස් සිද්දීක් (රළියල්ලාහු අන්හු) තුමා වෙත පැමිණි විට එතුමා ඇයට මෙසේ කීවේය: අල්ලාහ්ගේ ග්‍රන්ථයෙහි ඔබට කිසිවක් නැත. අල්ලාහ්ගේ දූතයා ඔබ වෙනුවෙන් යමක් නියම කළ බව මම නොදනිමි. එනමුත් මම ජනයින්ගෙන් විමසා සිටින්නම් යැයි ඇයට පවසා පසුව එතුමා තම මිතුරන්ගෙන් ඒ ගැන විමසූ අතර, ඔවුන්ගෙන් සමහරෙකු නබි -සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්- තුමාණෝ මිත්තණියට හයෙන් එක් පංගුවක් ලබා දුන් බවට සාක්ෂි දුන්හ. ඒ අනුව එතුමාණෝ ඒ මිත්තෙණියට හයෙන් එක් පංගුවක් ලබා ගත හැකි බවට තීන්දුව නිකුත් කළහ. "**ජනයා අතර අල්කුර්ආනය මඟින් තින්දු ලබා දෙන්න. ඒ තුළ ඒ නිශ්චිත කරුණු පිළිබඳ තීන්දු ඔබ නොදුටුවේ නම් අල්ලාහ්ගේ දූතයාණන්ගේ සුන්නාහ්ව මඟින් තීන්දු ලබා දෙන්න**" යැයි උමර් (රළියල්ලාහු අන්හු) තුමා තම සේවකයින්ට උපදෙස් දුන්හ.

ගැබිනි කාන්තාවකට කෙනෙකු පහර දී, ඒ හේතුවෙන් මළ දරුවෙකු ප්‍රසූතිය ඇය සිදු කිරීම පිළිබඳ තීන්දුව ගැන එතුමාට ව්‍යාකූල වූ විට, එතුමා ඒ ගැන සහාබාවරුන්ගෙන් විමසා සිටියහ. වහලෙකු හෝ වහලියකු වන්දියක් ලෙස ලබා දෙන ලෙස නබි -සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්- තුමාණන් නියෝග කළ බව මුහම්මද් බින් මස්ලමා සහ අල්-මුගෙයිරා බින් ෂුඃබා රළියල්ලාහු අන්හු යන සහාබිවරුන් එතුමා ඉදිරියේ සාක්ෂි දුන්හ. ඒ අනුව එතුමා එම නීතිය නියම කළේය.

සිය සැමියා මිය ගිය කාන්තාවක් තම ඉද්දා කාලය සිය නිවසෙහි රැඳී සිටීම පිළිබඳ තීන්දු පැතූ විට උස්මාන් (රළියල්ලාහු අන්හු) තුමා අවුලට පත්විය. එවිට අබූ සර්ද් (රළියල්ලාහු අන්හු) තුමාගේ සහෝදරිය වන ෆරීආ බින්ත් මාලික් බින් සිනාන් (රළියල්ලාහු අන්හා) තුමිය නබි -සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්- තුමාණෝ ඇයගේ සැමියා මිය ගිය විට ඉද්දා හි නියමිත කාලය අවසන් වන තෙක් ඇයගේ නිවසෙහි රැඳී සිටින මෙන් ඇයට නියෝග කළ බව පවසා සිටියාය. ඉන්පසු එතුමාණෝ ඒ ප්‍රකාශය අනුව තීන්දු දුන්හ.

එමෙන්ම, වලීද් බින් උක්බා නැමැත්තාට මත්පැන් පානය කළ වරදට දඬුවම ක්‍රියාත්මක කිරීමට ද සුන්නාහ්ව ආධාරයෙන් එතුමා නියෝග දුන්හ. උස්මාන් (රළියල්ලාහු අන්හු) තුමා හජ් සහ උම්රා කර්තව්‍යයන් දෙක එකම ගමනක ඉටු කිරීම තහනම් යැයි අලී (රළියල්ලාහු අන්හු) තුමාගේ ඥාතීන්ට පැවසූ බව අලී (රළියල්ලාහු අන්හු) තුමා වෙත ආරංචිය ලැබුනු කල්හි, එවිට, "**එක් මිනිසෙකුගේ ප්‍රකාශය ඉදිරියේ මා අල්ලාහ්ගේ දූතයාණන් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්ගේ සුන්නාහ්ව අත් නොහරිමි**" යැයි එතුමා පවසා සිටියහ.

අබූ බක්ර් හා උමර් -රළියල්ලාහු අන්හුමා- තුමාණන්ලාගේ ප්‍රකාශය අනුව හජ් සහ උම්රා යන කර්තව්‍යයන් දෙක එකම ගමනක ඉටු කිරීම විෂයෙහි හජ් කර්තව්‍යය පමණක් ඉටු කිරීම උචිත වේ යනුවෙන් ඇතැම් අය ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා සමඟ වාදයක නිරත වූ විට ඉබ්නු අබ්බාස් තුමාණෝ මෙසේ පැවසූහ: "**දේව දූතයාණන් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් පැවසූ බවට මම යමක් පවසන විට, ඔබලා අබූ බක්ර් හා උමර් පැවසූ බවට යමක් පැවසීමෙන් ඔබලා මත, අහසින් ගලක් පහළ වේවි (දෝ යයි බිය වෙමි).**" අබූ බකර් සහ උමර්ගේ ප්‍රකාශය අනුව සුන්නාහ්ව කඩ කරන්නාට පවා දඬුවම ගැන බිය වන්නේ නම්, වෙනත් අයගේ ප්‍රකාශයක් නිසා හෝ පුද්ගලික මතය සහ ඉජ්තිහාද් හෙවත්, සිය

කැමැත්තෙන් ආගමික නිගමනය තේරුම් ගන්නට කටයුතු කරන්නාගේ තත්ත්වය කෙසේවන්නේ ද? තවද, ඇතැම් සුන්නාහ් පිළිබඳ අබ්දුල්ලාහ් බින් උමර් (රළියල්ලාහු අන්හු) තුමා සමග සමහර අය වාද කළ විට, "**අපට උමර්ව අනුගමනය කිරීමට අණ කර තිබේද? නැතහොත් සුන්නාහ්ව අනුගමනය කිරීමට අණ කර තිබේද?**" යැයි එතුමා ඔවුනට පවසා සිටියහ.

ඉම්රාන් බින් හුසයින් (රළියල්ලාහු අන්හු) තුමා සුන්නාහ් පිළිබඳ කතා කරමින් සිටියදී, "අප සමග අල්ලාහ්ගේ ග්‍රන්ථය පිළිබඳ කතා කරන්න" යැ මිනිසෙකු කියා සිටියේය. එවිට එතුමා කෝපයට පත් වී මෙසේ පැවසූහ: "**සැබැවින්ම සුන්නාහ් යනු අල්ලාහ්ගේ ග්‍රන්ථයට පැහැදිලි කිරීමකි. සුන්නාහ් නැති නම් ළුහර් සලාතයේ රක්අත් ගණන හතරකි, මග්‍රිබ් සලාතයේ රක්ආත් ගණන තුනකි, ෆජ්ර් සලාතයේ රක්අත් ගණන දෙකකි යනුවෙන් අපි දැන සිටියේ නැත. එමෙන්ම සුන්නාහ්වෙහි පැහැදිලි ව පැමිණි සකාත් පිළිබඳ විස්තර සහ අනෙකුත් තීන්දු පිළිබඳ විස්තර අපි දැන සිටියේ නැත.**"

සුන්නාහ්වට ගරු කිරීම, ඒ අනුව ක්‍රියා කිරීමේ අනිවාර්යභාවය සහ ඊට එරෙහිව යාම පිළිබඳ අනතුරු ඇඟවීම සම්බන්ධයෙන් සහාබාවරුන්ගෙන් පැමිණි වාර්තා බොහෝය. ඒ අතරින් තවත් කරුණක් වන්නේ, අබ්දුල්ලාහ් බින් උමර් (රළියල්ලාහු අන්හුමා) තුමා, නබි -සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් - තුමාණන්ගේ ප්‍රකාශයක් වන: "**අල්ලාහ්ගේ දේවස්ථානය වෙත පැමිණෙන අල්ලාහ්ට ගැති කාන්තාවන් නො වළක්වන්න.**" යනුවෙන් පැවසූ අවස්ථාවේ දී "අල්ලාහ් මත දිවුරා පවසන්නෙමු. සැබැවින් ම ඔවුන්ව අපි වළක්වන්නෙමු" යැයි එතුමාගේ දරුවන්ගෙන් ඇතැම් අය පවසා සිටියෝය. එවිට එතුමා කෝපයට පත් වූහ. ඔවුනට දැඩි ලෙස බැන වැදී මෙසේ පැවසූහ: "**මා අල්ලාහ්ගේ දූතයාණන් පැවසූ බව පවසා සිටින නමුත් ඔබ 'අල්ලාහ් මත දිවුරා පවසන්නෙමු.**

**සැබැවින් ම ඔවුන්ව අප වළක්වන්නෙමු' යැයි පවසන්නෙහි ද?"**

නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාගේ සගයකු වන අබ්දුල්ලාහ් බින් අල් මුගෆ්ෆල් අල් මුසනී (රළියල්ලාහු අන්හු) තුමා, සිය ඥාතීන් අතරින් කෙනෙකු යමක් විසි කරන අයුරු දුටු විට එයින් වැළක්වූහ. නියත වශයෙන්ම නබිවරයාණන් ඔහුට මෙසේ පැවසූ බව ප්‍රකාශ කළේය. "**ඇඟිලි අතර ගල් කැටයක් හෝ වෙනත් යමක් තබා විසි කිරීම තහනම් කළහ. තවදුරටත් ඔහු "එය කිසිදු දඩයමක් දඩයම් නොකරයි. සතුරෙකු තුවාල නොකරයි. එනමුත් එය දත කඩයි, ඇස තුවාල කරයි." යනුවෙන් කීවේය. ඉන්පසුවත් ඔහු එසේම සිදු කරන අයුරු දුටු විට, එතුමා: අල්ලාහ් මත දිවුරා "කිසිදා මා ඔබ සමඟ කතා නොකරමි. අල්ලාහ්ගේ දූතයාණන් - සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්- තහනම් කළ බව මා ඔබට පවසා සිටියෙමි. ඉන් පසුවත් ඔබ එය නැවත සිදු කරන්නෙහි ද?" යනුවෙන් පවසා සිටියේය."**

● කීර්තිමත් තාබිඃවරයකු වන අය්යූබ් අස්සඛ්ඃතියානී තුමා විසින් වාර්තා කළ බව සඳහන් ප්‍රකාශයක් බයිහකී ග්‍රන්ථයේ මෙසේ සදහන් වේ. "**ඔබ සුන්නාහ්ව පිළිබඳ කෙනෙකු සමඟ කතා කරමින් සිටියදී, ඔහු 'මෙය අත් හැර අල්කුර්ආනය පිළිබඳ කතා කරමු" යනුවෙන් පැවසුවහොත් ඔහු නොමඟ ගිය අයෙකු බව ඔබ දැනගන්න."**

● අල් අව්සාZඊ (රහිමහුල්ලාහ්) තුමා මෙසේ පැවසූහ: "සුන්නාහ්ව වනාහි අල්කුර්ආනයට පැහැදිලි කිරීමකි. නැතහොත් එහි සංෂිප්ත දෑ විවරණය කිරීමකි. නැතහොත් එහි සඳහන් නොවූ නීති පිළිබඳ හෙළිදරව් කිරීමකි." ඒ පිළිබඳ උත්තරීතර අල්ලාහ්ගේ ප්‍රකාශයෙහි මෙසේ සඳහන් වේ: "**තවද ඔවුන් වෙත පහළ කරනු ලැබූ දෑ ජනයාට නුඹ පැහැදිලි කරනු පිණිස නුඹ වෙත (අල් කුර්ආනය නොහොත්) මෙම මෙනෙහි කිරීම අපි පහළ කළෙමු. තවද එය ඔවුන් සිතා බලනු පිණිසය."**

● නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාගේ මෙම වදන මීට පෙරාතුව ද සඳහන් විය. "**අහෝ දැන ගන්න! සැබැවින්ම ධර්ම ග්‍රන්ථය ද ඊට සමාන දෑ ද මා හට ලැබී ඇත.**"

● ආමිර් අෂ්ෂඃබී (රහිමහුල්ලාහ්) තුමා මෙසේ පැවසූ බව බයිහකී හි මෙසේ සඳහන් වේ: "**ඔබට විනාශය අත් වූයේ නබිතුමාගේ සම්ප්‍රදායන් අත්හළ අවස්ථාවකය.**" එනම් සහීහ් හෙවත් වාර්තා දාමය නිවැරදි වූ සත්‍ය නබිවදන් එයින් අර්ථවත් වේ.

● අල් අව්සා$^{Z}$ඊ (රහිමහුල්ලාහි) තුමා පිළිබඳ බයිහකී ග්‍රන්ථයෙහි මෙසේ සඳහන් වේ. එතුමාගේ ඇතැම් මිතුරන්ට එතුමා මෙසේ උපදෙස් දුන්හ. "**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමා පැවසූ යම් හදීසයක් ඔබට ලැබුණේ නම් එය ගැන විරුද්ධව කිසිවක් කීමෙන් පරිස්සම් වන්න. මන්ද අල්ලාහ්ගේ දූතයාණන් එය දන්වා සිටිනුයේ අල්ලාහ් වෙතින් නිසාය.**"

● කීර්තිමත් ඉමාම්වරයකු වන සුෆ්යාන් බින් සඊද් අස් සව්රී (රහිමහුල්ලාහ්) තුමා පැවසූ බව බයිහකී ග්‍රන්ථයෙහි මෙසේ සඳහන් වේ. "**සැබැවින්ම පූර්ණ දැනුම වනාහි නබිතුමාගේ සම්ප්‍රදායන් පිළිබඳ අවබෝධය වේ.**"

● මාලික් (රහිමහුල්ලාහ්) තුමා මෙසේ ප්‍රකාශ කර ඇත: "අල්ලාහ්ගේ දූතයාණන්ගේ - සල්ලල්ලාහු අලෙයිහිවසල්ලම් - මිනීවල දෙස සංඥා කරමින් "**මේ මිනීවලට අයිති කෙනා හැර, අප සියළු දෙනාගෙන් වලංගු හා අවලංගු ප්‍රකාශයන් නිකුත් වේ.**"

● අබූ හනීෆා (රහිමහුල්ලාහ්) තුමා මෙසේ පවසා ඇත: "**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) පැවසූ යම් හදීසයක් පැමිණියේ නම් එයට හිස හා නෙත් යොමුවිය යුතුයි.**"

● ෂාෆිඊ (රහිමහුල්ලාහ්) තුමා මෙසේ පැවසූහ: "**නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් පැවසූ බවට නිවැරදි**

**වාර්තා දාමයකින් යුත් යම් සත්‍ය හදීසයක් මට ලැබී මා එය නොගෙන සිටියේ නම් සැබැවින්ම මාගේ මනස ව්‍යවුල් වනු ඇතැයි මම ඔබට පවසා සිටිමි."**

● එතුමා තවදුරටත් මෙසේ ද පැවසූහ: "**මා යම් ප්‍රකාශයක් නිකුත් කර, අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්- තුමා පැවසූ හදීසයකට එය පටහැනිව තිබුණේ නම් මාගේ ප්‍රකාශය ඉවත දමන්න.**"

● අහ්මද් ඉබ්නු හන්බල් (රහිමහුල්ලාහ්) තුමා මෙසේ පැවසූහ: "**මා අනුගමනය නොකරන්න. ඉමාම්වරු වන මාලික් හා ෂාෆිඊ යන අයව ද අනුගමනය නොකරන්න. අප කුමන ස්ථානයෙන් එය ලබා ගත්තෙමු ද එහි සිටම ඔබ ලබා ගන්න.**"

● එතුමා මෙසේ ද පැවසූහ: "අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) පටන් පැමිණෙන සම්ප්‍රේෂණ දාමය හා එහි නිවැරදිබාවය ගැන දන්නා ඇතැම් පිරිස් ගැන මා විශ්මයට පත් වෙමි. ඔවුන් සුෆ්යාන් වෙත යති. එනමුත් අල්ලාහ් මෙසේ පවසා ඇත:"**කවරෙකු ඔහුගේ නියෝගයට පිටුපාන්නේ ද, ඔහු තමන්ට ඇති විය හැකි යම් පරීක්ෂණයක් හෝ වේදනීය දඬුවමක් කෙරෙහි බියෙන් පසුවෙත්වා.**" "ෆිත්නා යනු කුමක් දැයි ඔබ දන්නෙහි ද?" යැයි ඔහු විමසුවේය. ෆිත්නා යනු අල්ලාහ්ට ආදේශ තැබීම වේ. එය දේව දූතයාණන්-අලෙයිහි සලාතු වස්සලාම්-ගේ සමහර ප්‍රකාශ ප්‍රතික්ෂේප කිරීමෙන් සිතේ ඇති වන යම්කිසි නොමග යෑමකින් ඇති විය හැක. පසු ව එමඟින් ඔහු විනාශයට පත් වේ.

● මුජාහිද් බින් ජබ්ර් නැමැති කීර්තිමත් තාබිඊවරයකු පහත සඳහන් අල්කුර්ආන් වැකිය පිළිබඳ මෙසේ පැවසූ බව බයිහකී ග්‍රන්ථයෙහි මෙසේ සඳහන් වේ: "**නමුත් යම් කරුණක නුඹලා එකිනෙකා මත ගැටුම් ඇති කර ගත්තෙහු නම්, එවිට එය අල්ලාහ්**

**වෙත ද රසූල්වරයා වෙත ද යොමු කරනු."** මේ වැකිය පිළිබඳ එතුමා මෙසේ පැවසූහ: **"අල්ලාහ් වෙත" යනු අල්ලාහ්ගේ ග්‍රන්ථය වන අල්කුර්ආනය වෙත වේ. "රසූල්වරයා වෙත" යනු සුන්නාහ්ව වෙත වේ.**

● අස් සුහ්රී (රහිමහුල්ලාහ්) තුමා පැවසූ බව බයිහකී ග්‍රන්ථයේ මෙසේ සඳහන් වේ: **"අපෙන් ඉකුත්ව ගිය අපගේ විද්වතුන්, "සුන්නාහ්ව සමඟ දැඩි ලෙස බැඳී සිටීම ජයග්‍රහණය වේ" යනුවෙන් පවසමින් සිටියහ."**

● මුවෆ්ෆකුද් දීන් බින් කුදාමා (රහිමහුල්ලාහ්) තුමා රව්ළතුන් නාළිර් නමැති ග්‍රන්ථයේ නීතිවල මූලධර්ම පිළිබඳ පැහැදිලි කිරීමේදී මෙසේ සඳහන් කර ඇත. **"මූලධර්ම වලින් දෙවන මූලධර්මය වනාහි රසූල් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්- තුමාගේ සුන්නාහ් ව වේ. රසූල් -සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්-තුමාගේ ප්‍රකාශය එක් මූලාධාරයකි. මන්ද එතුමා සත්‍ය පමණක් කතා කරන විෂ්මිත ස්වභාවය සහිත අයෙකි. තවද අල්ලාහ් එතුමාට කීකරු වන ලෙස නියෝග කොට එතුමාට විරුද්ධ වීම පිළිබඳ අනතුරු අඟවා ඇත."**

● උත්තරීතර අල්ලාහ්ගේ පහත සඳහන් ප්‍රකාශය විස්තර කිරීමේදී අල්-හාෆිල් ඉබ්නු කසීර් (රහිමහුල්ලාහ්) මෙසේ පවසයි: **"කවරෙකු ඔහුගේ නියෝගයට පිටුපාන්නේ ද ඔහු තමන්ට ඇති විය හැකි යම් පරීක්ෂාවක් හෝ වේදනීය දඬුවමක් කෙරෙහි බියෙන් පසුවෙත්වා.**

" එනම්: "ඔහුගේ නියෝගයට" යනු රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාගේ නියෝගයට වේ. එතුමාගේ නියෝගය යනු එතුමාගේ මාර්ගය, එතුමාගේ විෂය, එතුමාගේ ක්‍රමය, එතුමාගේ සුන්නාහ්ව සහ එතුමාගේ පිළිවෙත වේ. සියලු ප්‍රකාශ සහ ක්‍රියා එතුමාගේ ප්‍රකාශ සහ ක්‍රියා සමඟ සසඳා බලනු ලැබේ. ඒවා එතුමාගේ ප්‍රකාශ සහ ක්‍රියාවලට එකඟ වූයේ නම් ඒවා පිළිගනු

ලැබේ. එයට වරුද්ධ වූයේ නම් එය කියන හා කරන කුමන අයෙකු වූවත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වේ. "**අප විෂයයෙහි නොමැති ක්‍රියාවක් කවරෙකු සිදු කරන්නේද එය ප්‍රතික්ෂේප කරනු ලැබූවකි.**"

"**බියෙන් පසුවෙත්වා**" එනම් දූතයාණන්ගේ පිළිවෙතට බාහිරව හා අභ්‍යන්තරව විරුද්ධ වන්නන් බියෙන් හා පරෙස්සම් වේවා.

"**තමන්ට ඇති විය හැකි යම් පරීක්ෂණයක් ගැන.**" එනම් තම සිත තුළ දේවත්වය ප්‍රතික්ෂේප කිරීම, කුහකත්වය හෝ දහම තුළ යම් නවක දෙයක් ඇති වීම ගැන.

"**නැතහොත් ඇති විය හැකි යම් වේදනීය දඬුවමක් කෙරෙහි**" එනම්, මෙලොවෙහි ඝාතනය කිරීමට ලක් වීම හෝ දඬුවමකට ලක් වීම හෝ සිරගතවීම හෝ එවැනි වෙනත් ප්‍රතිවිපාකයකට භාජනය වීම ගැන.

● හම්මාම් බින් මුනබ්බිහ් තුමා මෙසේ ප්‍රකාශ කළ බව මුඅම්මර් දන්වා, අබ්දුර් රස්සාක් අපට පැවසූ බව ඉමාම් අහ්මද් (රහිමහුල්ලාහ්) මෙසේ පවසයි: මෙය අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා අපට ප්‍රකාශ කළහ: අල්ලාහ්ගේ දූතයාණෝ -සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්- මෙසේ පැවසූහ. "**මට හා ඔබලාට උපමාවක් නම් ගිනි මොලවා ගත් මිනිසෙකු මෙනි. එය ඒ වටා එළිය ඇති කළ විට ගින්නට වැටෙන කෘමීන් එසේ ගින්නට වැටෙන්නට පටන් ගත්තේය. මිනිසා උන් වළක්වන්නට තැත් කළ ද ඔහු අබිබවා උන් ඒ ගින්නට ඇතුලු වෙති. මා හා ඔබලාට උපමාව එයයි. මා ඔබලාව ගින්නෙන් ඈත් කිරීම සඳහා ඔබලාව අල්ලා ගනිමි. එනමුත් ඔබලා මා ව අභිබවා ගොස් එහි ඇතුල් වන්නෝය.**" අබ්දුර් රස්සාක්ගේ හදීසයෙන් මෙය වාර්තා කර ඇත.

සුන්නාහ්ව මූලාධාරයක් ලෙස ගැනීම සම්බන්ධයෙන් ලියූ මිෆ්තාහුල් ජන්නා නමැති සන්දේශයේ සුයූති (රහිමහුල්ලාහ්) මෙසේ පවසා ඇත්තාහ: **"දැන ගන්න! අල්ලාහ් ඔබලාට කරුණා කරත්වා! සැබැවින්ම කවරෙකු නබි -සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්- තුමාණන්ගේ ප්‍රකාශයක් හෝ ක්‍රියාවක් ඒ ක්ෂේත්‍රයට අදාල කොන්දේසි සමඟ තිබියදී එය ප්‍රතික්ෂේප කරන්නේද, ඔහු සැබැවින්ම දේවත්වය ප්‍රතික්ෂේප කරන්නෙකි. ඔහු ඉස්ලාමීය රාමුවෙන් බැහැර වනු ඇත. ඔහු මතුලොවෙහි අල්ලාහ්ගේ කැමත්ත අනුව යුදෙව් හා කිතුනුවන් සමඟ හෝ දේවත්වය ප්‍රතික්ෂේප කරන වෙනත් ඕනෑම කණ්ඩායමක් සමඟ නැවත නැඟිටුවනු ලබයි."**

සුන්නාහ්ව හෙවත් නබි තුමාණන්ගේ පිළිවෙතට ගරු කිරීම, ඒ අනුව ක්‍රියා කිරීමේ අනිවාර්යභාවය සහ ඊට එරෙහිව යාම පිළිබඳ අනතුරු ඇඟවීම සම්බන්ධයෙන් සහාබාවරුන්ගෙන් සහ ඔවුනට පසු පැමිණි උදවියගෙන් පැමිණි වාර්තා බොහෝය. අප විසින් සඳහන් කර ඇති අල් කුර්ආන් පාඨ, හදීස් සහ ප්‍රකාශ සත්‍ය සොයන්නාට ප්‍රමාණවත් වනු ඇතැයි අප සිතමු. අල්ලාහ් තෘප්තියට පත්වන දෑ සිදු කිරීමටත් ඔහුගේ කෝපයට තුඩු දෙන කරුණුවලින් ආරක්ෂා වීමටත් අපට හා සියලු මුස්ලිම්වරුන්ට ආශිර්වාද කරන මෙන් අපි අල්ලාහ්ගෙන් ඉල්ලා සිටින්නෙමු. උන්වහන්සේගේ ඍජු මාර්ගයට අප සියල්ලන් යොමු කරනු සේක්වා. සැබැවින්ම ඔහු සර්ව ශ්‍රාවකය. ඉතා සමීපව සිටින්නාය.

“ ශාන්තිය හා සමාදානය අපගේ රසූල්වරයා වන මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ටත්, එතුමාණන්ගේ පවුලේ සාමාජිකයන්ටත්, හිතමිතුරන් හා අනුගාමිකයින්ටත් හිමිවේවා! ”

අබ්දුල් අ$^{z}$සීස් බින් අබ්දුල්ලාහ් බින් බා$^{z}$ස්
(අල්ලාහ් ඔහුට කරුණා කරත්වා!)